**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය - 2022**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව විශ්වවිද්‍යාලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගණුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගණුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම්කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසදීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසිපියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායි ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබීමහේතුවෙන් සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද පිරිවැය රු.867,706,599 ක් වූ වත්කම් විෂයයන් 13 ක් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නොතිබුණි. | මේ වන විට ඉඩම්වල සහ ගොඩනැගිලි වල ප්‍රත්‍යාගණන වටිනාකම් තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති අතර අනෙකුත් සියළුම සංචලන ස්ථාවර වත්කම් 2022 භාණ්ඩ සමීක්ෂණයට සමගාමීව අවශ්‍ය භෞතික සත්‍යාපනය කර ලේඛන සකස් කරමින් පවතින බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කල යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාලයේ අන්තර් සම්බන්ධතා කළමනාකරණ මෘදුකාංග පද්ධතිය (ERP System) වෙනුවෙන් 2021 වර්ෂය තුළදී ගෙවන ලද රු.5,250,000 ක් වූ පළමු වාරිකය කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කළ යුතු වුවත් අත්තිකාරම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | මේ වන විට තොග කළමනාකරණ මොඩලය, පොදු ලෙජර මොඩලය යන දෙක පූර්ණ වශයෙන් සංවර්ධනය කර ඇති අතර එම මොඩියුල භාර ගැනීමෙන් පසුව එම මුදල් කෙරීගෙන යන වැඩ ගිණුමට මාරු කරනු ලබන බව. | මෘදුකාංගය සඳහා ගෙවන ලද රු.5,250,000 ක් වූ පළමු වාරිකය නොනිම් වැඩ යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | විශ්වවිද්‍යාලය විසින් 2015 වර්ෂයේ රු.1,025,396,975 ක් වැය කරමින් අනුරාධපුර ශික්ෂණ රෝහල් භූමියේ ඉදිකර ඇති සායන ගොඩනැගිල්ල හා ආරක්ෂක කුටිය සඳහා 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ක්ෂය ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් ගොඩනැගිලි වටිනාකම රු.365,735,755 කින් හා පොදු සංචිතය රු.314,465,906 කින් වැඩියෙන් හා වර්ෂයේ ඌනතාවය රු.51,269,848 කින් අඩුවෙන් දක්වා තිබුණි. | විශ්වවිද්‍යාල මුදලින් ඉදිකලද ඉඩමේ පැවරීමේ කටයුතු නිසිලෙස සිදුවී නැති බැවින් මෙය විශ්වවිද්‍යාල දේපලක් ලෙස සලකා ක්ෂය කිරීමේ හැකියාවක් නැති බව. | විශ්වවිද්‍යාලයේ වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2021 වර්ෂයේදි අලි සංරක්ෂණ ඒකකය සඳහා පරිත්‍යාග ලෙස ලද ගොඩනැගිල්ල ඇතුළු කාර්යාල උපකරණ හා ගෘහ උපකරණ 142 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීමට ප්‍රථම හඳුනාගෙන ප්‍රත්‍යාගණනය කර 2023 වර්ෂයේ සිට ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලබන බව. | පරිත්‍යාග ලෙස ලද ගොඩනැගිල්ල ඇතුලු කාර්යාල උපකරණ තක්සේරු කර ගිණුම්ගත කල යුතුය. |
| (ඈ) | 2019 නොවැම්බර් මාසයේ වැඩ නිම කර භාරදෙන ලද පිරිවැය රු.12,166,249 ක් වූ ඝන අපද්‍රව්‍ය ඒකක ගොඩනැගිල්ලේ සවිකර ඇති යන්ත්‍රවල වටිනාකම ගොඩනැගිලි වටිනාකමින් වෙන්කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රදානයක් මත ඉදි කර තිබෙන මෙම Solid Waste Mgt ගොඩනැගිල්ල, ගොඩනැගිල්ලක් බැවින් ගොඩනැගිලි යටතේ වර්ග කර ඇති බව. | ගොඩනැගිල්ලේ වටිනාකම හා සවිකර ඇති යන්ත්‍රවල වටිනාකම නිවැරදිව වෙන්වෙන්ව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය. |
| (ඉ) | විශ්වවිද්‍යාලයේ ගබඩා 05 ක පැවති පිරිවැය රු.6,055,399 ක් වූ භාවිතයට නොගන්නා කල් ඉකුත් වූ තොග ජංගම වත්කමක් ලෙස අවසන් තොග ශේෂයේ ඇතුලත් වීම නිසා අවසන් තොගය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | මෙම භාණ්ඩ පිළිබද නැවත ඇගයීමකට ලක් කර සත්‍ය වශයෙන් උපයෝජනයට ගත හැකි භාණ්ඩ සහ තවදුරටත් කිසිදු සාධාරණ හේතුන් මත භාවිතයට ගත නොහැකි භාණ්ඩ පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් 2023 ගිණුම් සමග ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව. | අවසන් තොගයේ නිවැරදි වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂයට අදාළ නේවාසිකාගාර ආදායම රු.4,671,650 ක් වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ නේවාසිකාගාර ආදායම් ලෙස වර්ෂය තුළ මුදලින් ලද ආදායම වූ රු.2,172,088 ක් පමණක් දැක්වීම නිසා වර්ෂයේ ඌනතාවය රු.2,499,562 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ශිෂ්‍ය නේවාසිකාගාර ආදායම් නිසිලෙස උපචිත පදනම මත ගිණුම් තැබීමට 2023 වර්ෂයේ සිට අවශ්‍ය කටයුතු කරනු ලබන බව. | උපචිත පදනම මත ගිණුම් තැබීමට කටයුතු කල යුතුය. |
| (උ) | කෘෂිකර්ම පීය ගොවිපලෙහි 2022 දෙසැම්බර් 31 දිනට පැවති පොල්ගෙඩි 1,434 ක් සහ වී කි.ග්‍රෑම් 8,217 ක වටිනාකම් අගය කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. | විධිමත්ව පරීක්ෂා කර බලා අදාළ තොගයන් 2023 වර්ෂයේ දී තොගයට ඇතුළත් කර ගැනීමට කටයුතු කරනු ලබන බව. | වර්ෂය අවසාන තොගය නිවැරදිව අගයකර ගිණුම්ගත කල යුතුය. |

**1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| සවලීකරණ අත්තිකාරම් | 171,558,694 | 181,407,650 | 9,848,956 | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වැඩබිමට ප්‍රවේශවීමේ අත්තිකාරම් රු.171,558,694 ක් සඳහන් වන අතර උපලේඛනයේද එම අගයම සඳහන් වන බව. | ඉහත ප්‍රකාශන හා අනුරූපී වාර්තා අනුව වටිනාකම සැසඳිය යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | | |
| i. | XIX වැනි පරිච්ඡේදයේ 5.2 ඡේදය | උපලේඛනගත නිවාස ලබා ගැනීමට හිමිකමක් නැති නිලධාරියකුගෙන් නිවාස කුලී අයකල යුතු ආකාරය | රජරට විශ්වවිද්‍යාලය ඉතා දුෂ්කර ප්‍රදේශයක පිහිටා ඇති බැවින් ද රජයේ නිල නිවාසවලට වඩා අවම | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ |

| | | | | |
|---|---|---|---|---|
| | | සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ විධිවිධාන නොමැති විටක ආයතන සංග්‍රහයේ විධිවිධාන ඉක්මවා නොයන පරිදි කටයුතු කල යුතු වුවත් විශ්වවිද්‍යාලය විසින් පත්කරගත් නිවාස කමිටුවේ එකඟතාවය මත නිවාස කුලී ලෙස මාසිකව රු.400 සිට රු.1,500 දක්වා පරාසය තුළ නිලධාරීන් 180 දෙනෙකුගෙන් නිවාස කුලී මුදල් අයකර තිබුණි. | පහසුකම් ලැබී ඇති බැවින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් විමසීමක් සිදු කරන ලදී. භූගෝලීය පිහිටීම හා දුෂ්කරතා සැලකිල්ලට ගෙන විශ්වවිද්‍යාල නිවාස කමිටු වෙත යොමු කර නිවාස කුළි සකස් කරන ලෙස දන්වා තිබූ බව. ඒ අනුව විශ්වවිද්‍යාල පාලක සභාව විසින් පත් කරන ලද නිවාස කමිටුවේ තීරණය කරන ලද නිවාස කුලී නිවාස ලාභීන්ගේ වැටුපෙන් මාසිකව අඩුකරනු ලබන බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| ii. | XIX වැනි පරිච්ඡදයේ 5.3 ඡේදය සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතනික චක්‍රලේඛ අංක 09/2019 | උප ලේඛනගත නිවාස ලබා ගැනීමට හිමිකමක් ඇති නිලධාරියකුගේ මූලික වැටුපෙන් සියයට 10 ක් අයකල යුතු වුවද උපකුලපති නිල නිවාසය ලබාදීම වෙනුවෙන් නිලධාරියාගෙන් කිසිදු නිවාස කුලී මුදලක් අයකර නොතිබුණි. එමෙන්ම මෙම නිවස සඳහා ජල හා විදුලි බිල්පත් සඳහා එකතුව රු.197,335 විශ්වවිද්‍යාලය විසින් වැයකර තිබුණි. | විශ්වවිද්‍යාලය විසින් පසුගිය වසර ගණනාවක සිට පත්වූ උපකුලපතිවරුන් සඳහා නිල නිවාසය ලබා දී ඇත. 2022 වර්ෂයේ සිට මෙම නිල නිවාසය සඳහා මුදල් කමිටු අනුමැතිය මත මාසික ජල හා විදුලි බිල්පත් අගයෙන් සියයට 10 ක මුදලක් වැටුපෙන් අඩුකරමින් පවතින බව. | ආයතන සංග්‍රහයේ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ පරිදි කටයුතු කල යුතුය. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන මුදල් චක්‍රලේඛයෙහි ඡේද 9.1 මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (2) (ආ) වගන්තිය | භාණ්ඩාගාරයේ පූර්ව අවසරයකින් තොරව අග්‍රිම ලබාදිය හැකි රු.100,000 ක උපරිම සීමාව ඉක්මවා අවස්ථා 02 කදී රු.202,000 ක් සහ රු.961,620 ක අත්තිකාරම් ලබාදී තිබුණි. | අවශ්‍යතා මත අධීක්ෂණ නිලධාරීන් වෙත අත්තිකාරම් ලබාදී ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය xx පරිච්ඡේදයේ 3.1 ඡේදය | අධ්‍යන කාර්යය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහා රු.1,324,297,724 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | ඉදිරියේ දී අවශ්‍ය කටයුතු සිදු කරනු ලබන බව. | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.11,452,634 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,552,761 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.15,005,395 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට බාහිර පාඨමාලා ආදායම අඩු වීමත් සැපයුම් සහ ගිවිසුම්ගත සේවා වියදම් වැඩිවීමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **හඳුනාගත් පාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මිහින්තලය පරිශ්‍රයේ ද්විත්ව සේවක නිල නිවාස 04ක් ඉදිකිරීම සම්බන්ධයෙන් රු.52,703,236 කට අදාළ කොන්ත්‍රාත්තුව 2016 දෙසැම්බර් 23 වන දින පිරිනමා තිබුණු අතර ඒ වෙනුවෙන් සචලීකරණ අත්තිකාරම් ලෙස රු.15,859,979 ක් ගෙවීම් කර තිබුණි. එහෙත් කල වැඩ වටිනාකම රු.10,620,619 ක්ව පැවතියදී නියමිත පරිදි වැඩ ඉටු නොකිරීම හේතුවෙන් විශ්වවිද්‍යාලය විසින් 2019 පෙබරවාරි 20 දින ගිවිසුම අවසන් කර තිබුණි. එදිනට රු.15,760,611ක් තවදුරටත් කොන්ත්‍රාත්කරුගෙන් විශ්වවිද්‍යාලය වෙත අයකරගත යුතු වුවත් රු.3,952,742 ක් වූ අත්තිකාරම් බැඳුම්කරය හා රු.10,540,647 ක් වූ කාර්යයසාධන බැඳුම්කරය කල් ඉකුත්වීමට පෙර මුදල් කර ගැනීමට හැකියාව තිබියදීත් ඒ අනුව කටයුතු නොකිරීම නිසා විශ්වවිද්‍යාලයට රු.15,760,611 ක පාඩුවක් සිදු වී තිබුණි. | කොන්ත්‍රාත්තුව ප්‍රසම්පාදන ක්‍රමෝපායන්ට අනුව අවසන් කර වෙනත් අයෙක්ට ප්‍රදානය කිරීමට හැකියාවක්/උවමනාවක් විශ්වවිද්‍යාලයට නොතිබුණු අතර මෙම ව්‍යාපෘතිය 2018 අගෝස්තු කොන්ත්‍රාත්කරුගේ පැවැති මූල්‍ය අපහසුතා නිසා අත්හැර දමා තිබුණි. මේ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | කොන්ත්‍රාත්තුව අතරමඟ නවතා දැමීම හේතුවෙන් රජයට සිදුවූ අලාභය අත්තිකාරම් හා කාර්යයසාධන සුරක්ෂණය කල් ඉකුත් වීමට පෙර මුදල් කර නොගැනීමට අදාල වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඔවුන්ගෙන් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | කළමනාකරණ අධ්‍යන පීඨයට වායු සමීකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා රු.6,211,226 ක කොන්ත්‍රාත් වටිනාකමක් සහිතව තෝරාගත් සැපයුම්කරුවෙකු වෙත ප්‍රදානය කර තිබූ කොන්ත්‍රාත්තුවේ ප්‍රදානය කිරීමේ ලිපිය මාස 2 කට ආසන්න කාල පමාවක් සහිතව යවා තිබීම හේතුවෙන් සැපයුම්කරු විසින් එය භාර ගැනීම ප්‍රතික්ෂේප කර තිබුණි. ඒ වන විට ලංසු සුරක්ෂණය කල් ඉකුත් වී තිබුණු බැවින් එය මුදල් කර ගැනීමට තිබුණු හැකියාව මඟහැරී තිබුණි. මේ සම්බන්ධයෙන් විගණන දින වූ 2023 මැයි 31 දින වනතුරුත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 2021.08.18 පැවැති ප්‍රසම්පාදන කමිටු රැස්වීමේ දී ප්‍රදානය කිරීමට අනුමැතිය ලැබී ඇති අතර රටේ පැවැති කොරෝනා වසංගතය හේතුවෙන් 2021.10.03 දින ප්‍රදානය කිරීමේ ලිපිය අදාළ කොන්ත්‍රාත් සමාගමට යවා ඇත. රටේ ආර්ථික අස්ථාවරභාවය නිසා අදාළ ආයතනය මෙම ප්‍රසම්පාදන කාර්යය ප්‍රතික්ෂේප කර තිබුණි. ලංසු සුරක්ෂණය 2021.08.25 දින කල්ඉකුත් වී ඇත. | කළමනාකරණය විසින් ලංසු සුරක්ෂණය ලබාගත් වහාම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට කටයුතු කල යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 පෙබරවාරි 15 දිනෙන් පසු අලි සංරක්ෂණ ඒකකය කිසිදු අධ්‍යයන කටයුත්තක් සඳහා උපයෝජනය නොකර අවුරුදු 03 කට ආසන්න කාලයක් නිෂ්කාර්යයව පැවති අතර මෙම ඒකකයේ අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් 2021 වර්ෂයේදී රු.1,220,764 ක වියදමක්ද දරා තිබුණි. | 2023 පෙබරවාරි මස දේශිය මෙන්ම විදේශිය සිසුන්ගේ සහභාගිත්වයෙන් වනජීවී සම්බන්ධ පර්යේෂණ ආරම්භ කර ඇති බව දන්වමි. මෙයට අමතරව ජීව විද්‍යා අධ්‍යයනාංශයේ අධ්‍යයන කටයුතු ද මෙම ඒකකය තුල සිදු කරන ලද බව. | ව්‍යාපෘතියේ අරමුණු ඉටුවන පරිදි එම ඒකකයේ සම්පත් භාවිතයට ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | ගිවිසුම්ගත මුදල රු.42,979,355 ක් වූ වෛද්‍ය පීඨයේ ද්විත්ව නිල නිවාස 03 ක් සැලසුම් කර ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2017 මැයි 30 දින ආරම්භ කර අවස්ථා කිහිපයකදීම දින දීර්ඝ කිරීමෙන් පසු 2019 අප්‍රේල් 19 වන විට අවසන් කල යුතු විය. එහෙත් රු.29,239,233 ක කල වැඩ වටිනාකමින් අනතුරුව කොන්ත්‍රාත්කරු ඉදිකිරීම අතහැර තිබුණු අතර, ඒ දක්වා කොන්ත්‍රාත්කරුට රු.21,798,120 ක් ගෙවා තිබුණි. මෙම කොන්ත්‍රාත්තුවට අදාළව රු.2,148,967 ක් වූ කාර්යයසාධන සුරක්ෂණය හා රු.9,885,251 ක් වූ අත්තිකාරම් සුරක්ෂණය පිළිවෙලින් 2020 ජනවාරි 08 දින හා 2019 ජූලි 30 දින කල් ඉකුත්වී තිබුණු බැවින් එම සුරක්ෂණ මගින් රජයට අයවිය යුතු මුදල් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | මෙම ව්‍යාපෘතිය කොන්ත්‍රාත්කරුගේ පැවති මුල්‍යමය අර්බුද නිසා නියමිත දිනයන්හිදී නිම කිරිමට නොහැකි වී ඇත. මේ නිසා දඩ මුදල් ලෙස ද්‍රවශිලතා හානි ලෙස රු.4,297,935 ක මුදලක් කොන්ත්‍රාත් ගිවිසුමට අනුකූලව කොන්ත්‍රාත්කරුගෙන් අය කරගෙන ඇත. කොන්ත්‍රාත්කරු විසින් අදාළ ඇපකරවල කාලය දීර්ඝ කර විශ්වවිද්‍යාලයට ලබාදෙන බවට එකඟවී ඇත. තවද දැනට සිදු කර ඇති වැඩවල වටිනාකම රු.30,946,442 ක් වන අතර රු.2,148,967 රඳවුම් මුදල ද රු.4,297,935 ක ද්‍රවශීල හානි ද රු.8,595,871 ක මුළු අත්තිකාරම් මුදල ද අයකර ගත් පසු කොන්ත්‍රාත්කරු වෙත රු.92,090.38 ක මුදලක් ගෙවීමට ඇති බව. | අත්තිකාරම් සුරක්ෂණය සහ කාර්යයසාධන සුරක්ෂණය කල් ඉකුත්වීමට පෙර මුදල් කර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වෛද්‍ය පීඨයේ පුස්තකාලයේ පරිහරණය සඳහා 2011, 2019 හා 2020 යන වර්ෂයන්හි මිලදී ගන්නා ලද පොත් 194 ක් සඳහා ගෙවිය යුතුව තිබූ රු.2,383,594 ක (US $12,308) මුදල සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ගෙවා නොතිබුණි. මෙම කාලය තුළ සිදුවූ විනිමය අනුපාතයේ ඉහළයාම මත සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.584,993 ක් අතිරේකව දැරීමට සිදුවී තිබුණි. | විශ්වවිද්‍යාලය විසින් මෙම කාරණය සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග සිදුකෙරෙමින් පවතින බව. | ණය හිමියන් නිරවුල් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාලය සඳහා අන්තර් සම්බන්ධතා කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා 2020 දෙසැම්බර් 31 දින කොන්ත්‍රාත් වටිනාකම රු.17,500,000 කට ගිවිසුම්ගත වී 2021 දෙසැම්බර් 31 දින නිම කර භාර දිය යුතු වුවත් විගණිත අවස්ථාව වූ 2023 මැයි 31 දින වන තුරුත් නිම කර විශ්වවිද්‍යාලය වෙත භාරදී නොතිබුණි. | මෙය මොඩියුල 9ක් සහිතව ක්‍රියාත්මක වන එකක් වන අතර මේ වන විට ඉතා සංකීර්ණ පද්ධති 03ක් ක්‍රියාත්මක කරමින් පවතී. එසේම අනිකුත් මොඩියුල මොඩියුල 50% කට වඩා ඉහල තත්ත්වයක සංවර්ධන කටයුතු සිදු කර ඇති බව. | අන්තර් සම්බන්ධතා මෘදුකාංග පද්ධතියේ ඉදිකිරීම් ගිවිසුම් ප්‍රකාරව කඩිනමින් අවසන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම කල යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා බැඳුණු මෙහෙයුම් අත්පොතෙහි 6.6 ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂය අවසාන වී දින 60 ක් තුළ එම වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම 2023 අප්‍රේල් 06 දින දක්වා ප්‍රමාද වී තිබුණි. | මෙම ප්‍රමාදයට හේතුව වන්නේ මූල්‍ය අංශයේ පවතින මූල්‍ය නිළධාරීන්ගේ හිග බව. | මුදල් වර්ෂය අවසාන වී දින 60 ක් තුළ එම වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. |